සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivanery I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ශෛවනෙරි I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන වරණවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** "තම්බිදනක් කාහවනත් තණෛවෝනේ, තන්දෙ වැලත් තාලරුල්කෙක් කනියෝනේ" යනුවෙන් වර්ණනා කෙරෙනු ලබන්නෙ කවරෙක්ද?
(1) මුරුගන් (2) සිවපෙරුමාන් (3) විනායගර් (4) තිරුමාල්

**2.** පංචක්‍රියා අතුරින් 'තිරෝපවම්' යන්නෙන් අදහස් වන්නේ,
(1) මැවීම ය. (2) රැකබලා ගැනීම ය. (3) විනාශ කිරීම ය. (4) නොපෙන්වීම ය.

**3.** තිරුමාල් ප්‍රධාන දෙවියන් ලෙස අදහන මාර්ගය වන්නේ,
(1) ශෛවම් ය. (2) සාක්තම් ය. (3) වෛෂ්ණවම් ය. (4) කාණාපත්තියම් ය.

**4.** 'තණ්ණළි වෙණ්කුඩෛ වේන්දන්' යනුවෙන් පෙරිය පුරාණම්හි වර්ණනා කරනු ලබන රජතුමා වන්නේ,
(1) නින්රසීර් නෙඩුමාරන් ය. (2) මනුනීති කණ්ඩ චෝලන් ය.
(3) සේරමාන් පෙරුමාල් ය. (4) අනපාය චෝලන් ය.

**5.** ආගම් ක්‍රමයට අනුව වන්දනා කරන විට වෛරවර් හඳුන්වනු ලබන්නේ කෙසේද?
(1) සුඩලෛ වෛරවර් (2) කාට්ටු වෛරවර්
(3) රත්ත වෛරවර් (4) ඥාන වෛරවර්

**6.** "මාලර නේයම් මැලින්දවර් වේඩමුම්" යන ගීත පදයෙන් වර්ණනා කරනු ලබන්නන් වන්නේ,
(1) ශිව භක්තිකයන් ය. (2) දෙවිවරුන් ය.
(3) රජවරුවන් ය. (4) අසුරයන් ය.

**7.** ස්වාමි විපුලානන්දර් කතෘවරයෙක් ලෙස සේවය කළ දෙමළ මාධ්‍ය සඟරාව වන්නේ,
(1) යාල් නූල් ය. (2) වේදාන්ත කේසරි ය.
(3) මදංක සූලාමණි ය. (4) රාමක්‍රිෂ්ණ විජයම් ය.

**8.** තිරුවාදිරෛ දිනයේ පවත්වනු ලබන 'නඩේසර් අබිශේහ තරිසනම්' හඳුන්වනු ලබන්නේ කෙසේද?
(1) ආරුත්‍රා තරිසනම් (2) සිවලිංග තරිසනම්
(3) විනායගර් තරිසනම් (4) තිරුක්කෙලාය තරිසනම්

**9.** "පඩමාඩක් කෝයිල් ..." යනුවෙන් ආරම්භ වන ගීතයේ ජනතාවට කරන සේවාව දෙවියන් විසින් කැමැත්තෙන් පිළිගනු ලබයි යැයි පවසන්නේ,
(1) තිරුවිසෛප්පා ය. (2) තිරුමන්දිරම් ය.
(3) තිරුවාසගම් ය. (4) තේවාරම් ය.

[දෙවැනි පිටුව බලන්න.

**10.** “ඇරිදු ඇරිදු මානිඩරාදල් ඇරිදු” යනුවෙන් පැවසුයේ,
(1) තිරුවල්ලුවර් ය. (2) ඖවෛයාර් ය.
(3) තිරුමූලර් ය. (4) පාරදියාර් ය.

**11.** දෙවියන් සඳහා දුම ඇල්ලීම වෙනුවෙන් තම බිරිඳගේ තැල්ල විකුණන ලද්දේ,
(1) අප්පූදියඩිහල් ය. (2) සිරුත්තොණ්ඩර් ය.
(3) කුංගිලියක්කලයර් ය. (4) ඉලෛයාන්තුඩිමාර නායනාර් ය.

**12.** ශෛව ආගම අවධාරණය කරනු ලබන ජීවිතයේ අවධි හතරෙන් අනෙකුත් අවධිවල සිටින්නන්ටත් උපකාරී අවධිය වන්නේ,
(1) බ්‍රහ්මචරියම් ය. (2) ඉල්ලරම් ය.
(3) වානප්ප්‍රස්තම් ය. (4) තුරවරම් ය.

**13.** ශ්‍රී ලංකාවේ චෝළ පාලන සමයේ පිහිටුවන ලද 2වැනි ශිව දේවාලය හඳුන්වනු ලබන වෙනත් නමක් වන්නේ කුමක්ද?
(1) වානවන් මාදේවි ඊශ්වරම් (2) ජනනාදමංගලම්
(3) උත්තම චෝලේස්වරම් (4) විජයරාජ ඊශ්වරම්

**14.** චින්න කදිර්කාමම් යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලාංකේය කෝවිල වන්නේ,
(1) ඉණුවිල් කන්දස්වාමි කෝවිල ය.
(2) මණ්ඩූර් කන්දස්වාමි කෝවිල ය.
(3) නල්ලූර් කන්දස්වාමි කෝවිල ය.
(4) වෙරුගල් සිත්තිරවේලායුදර් කෝවිල ය.

**15.** ශෛව විත්තියාවිරුත්ති සංගමය මගින් යාපනයේ ශෛවාසිරිය කලාසාලෛ පිහිටවනු ලැබූ ස්ථානය වන්නේ,
(1) තිරුනෙල්වේලි ය. (2) චුන්නාකම් ය.
(3) උරුම්පිරායි ය. (4) කෝපායි ය.

**16.** නාලායිර දිව්‍යප්‍රබන්ධ කතෘවරුන්ගෙන් දෙදෙනෙකු වන්නේ,
(1) තොණ්ඩරඩිප් පොඩියාල්වාර් සහ සේදිරායර් ය. (2) නම්මාල්වාර් සහ පුනිදවදියාර් ය.
(3) තොණ්ඩරඩිප් පොඩියාල්වාර් සහ නම්මාල්වාර් ය. (4) පුනිදවදියාර් සහ සේදිරායර් ය.

**17.** “නෙක්කුළ් ආර්වම් මිහප්පෙරුහි ...” යනුවෙන් සම්බන්තප්පෙරුමාන් ගැයූ තේවාරමේ විශේෂයෙන් හඳුන්වනු ලබන ශිව සංකේත වන්නේ,
(1) විභූති සහ උරුත්තිරාක්කම් ය. (2) උරුත්තිරාක්කම් සහ පංජාට්චරම් ය.
(3) විභූති සහ පංජාට්චරම් ය. (4) විභූති, උරුත්තිරාක්කම් සහ පංජාට්චරම් ය.

**18.** ශිවලිංග මූර්තයේ පීඩම් සහ ලිංගම් යනාදියෙන් සංකේත වන්නේ පිළිවෙළින්,
(1) විශ්ණු දෙවියන් සහ ශිව දෙවියන් ය. (2) ශිව දෙවියන් සහ බ්‍රහ්ම ය.
(3) ශක්ති මෑණියන් සහ විශ්ණු දෙවියන් ය. (4) ශක්ති මෑණියන් සහ ශිව දෙවියන් ය.

**19.** ශෛවසිද්ධාන්තම් හි නිශ්චිත ද්‍රව්‍ය ලෙස සලකනු ලබන දේවල් අතුරින් ‘පාසම්’ යනු,
(1) දැනුම්දීමෙන් දැන ගන්නා දෙයක් ය. (2) දැනුම්දීමෙන් තොරව දැන ගන්නා දෙයක් ය.
(3) දැනුම් දුන්නත් නොදන්නා දෙයක් ය. (4) ඥානයේ සංකේතයයි.

**20.** තිරුනාවුක්කරසර්, ත්‍රිසූල සහ රිෂබ මුද්‍රා තමාගේ උරහිසේ තබන ලෙසට දෙවියන්ගෙන් ඉල්ලා ගැයූ ගීතය වන්නේ,
(1) “තිරුවඩික්කු ඔන්රුණ්ඩු විණ්ණප්පම් ...” (2) “පණ්ණිනේර් මොළියාල් උමෛ පංගරෝ ...”
(3) “ඔණ්රු කොලාම් අවර් සින්දෛ ...” (4) “මාදර්ප් පිරෛක් කණ්ණියානෛ ...”

**21.** තිරුමුරෛ යන්නෙහි අර්ථය වන්නේ,
(1) මෙය මීට පෙර මෙසේ සිදුවිය යන්න ය.
(2) පුරාතන කාලයේ සිට පැමිණෙන ඥානය යන්න ය.
(3) මිනිසුන් විසින් සකස් නොකෙරුණු දෙයක් යන්න ය.
(4) දිව්‍යමය ගීතවල සම්පාදනය යන්න ය.

**22.** හින්දු භක්තිකයන් විසින් පවත්වනු ලබන ‘විත්තියාරම්බම්’ යනු
(1) නිත්‍ය කිරියෛවලින් එකකි. (2) අපර කිරියෛවලින් එකකි.
(3) පූර්ව කිරියෛවලින් එකකි. (4) සිරාර්ත්ත කිරියෛවලින් එකකි.

0312

**23.** දෙවියන්ගේ තඩත්ත නිලෙල යනු,
(1) මනස, වැකිය සහ දේහය යනාදියෙන් ඔබ්බට ගිය තත්ත්වයයි.
(2) ආත්මයන්ට ආශිර්වාද කිරීමට පැමිණි තත්ත්වයයි.
(3) ගුණවත්කමින් ඔබ්බට ගිය තත්ත්වයයි.
(4) කැමැත්ත සහ අකැමැත්ත යනාදිය පසු කළ තත්ත්වයයි.

**24.** හින්දු ආගම 'සනාතන ධර්මය' යනුවෙන් හැඳින්වීමට හේතුව වන්නේ,
(1) ආගමික මාර්ග හයක් ඇති නිසා ය.
(2) වේද, පොදු ග්‍රන්ථයක් ලෙස තිබෙන නිසා ය.
(3) අනාදිමත් කාලයක සිට ස්ථිරව තිබෙන නිසා ය.
(4) කෝවිල් වන්දනාවට වැදගත් තැනක් ලබා දෙන නිසා ය.

**25.** විභූතිය, 'ෂාරම්' යනුවෙන් නම් කිරීමට හේතුව වන්නේ,
(1) පච් පුළුස්සා අළු බවට පත්කිරීම නිසා ය.
(2) ජීවින්ගේ ත්‍රිමළ නැති කිරීම නිසා ය.
(3) ඉහළම ධනය ලබා දෙන නිසා ය.
(4) ආලේප කර ගත් ආත්මයන් ආරක්ෂා කරන නිසා ය.

**26.** විවාහ කිරියෙෙ පමණක් ඇතුළත් වරණය වන්නේ,
(1) මංගල නීරාට්ටුදල්, අස්තිසන්ජයනම් සහ අන්දියේට්ටි ය.
(2) අග්නි වටේ ඇවිද්දගෙන යාම, මිරිස්ගල මත පය තැබීම සහ තැල්ල බැඳීම ය.
(3) වීට්ටුක් කිරුත්තියම්, නාමහරණම් සහ සපිණ්ඩිහරණම් ය.
(4) මිරිස්ගල මත පය තැබීම, සපිණ්ඩිහරණම් සහ තැල්ල බැඳීම ය.

**27.** වරදපණ්ඩිතර් විසින් රචනා කරන ලද ග්‍රන්ථ පමණක් ඇතුළත් වරණය වන්නේ,
(1) තට්චිණ කෙලාස පුරාණම්, පිල්ලෙයාර් කතෙ සහ ඒහාතසි පුරාණම් ය.
(2) පරාලෙවිනායහර් පල්ලු, ඒහාතසි පුරාණම් සහ සිවරාත්‍රී පුරාණම් ය.
(3) ඒහාතසි පුරාණම්, කැල්වලෙයන්තාදි සහ පිල්ලෙයාර් කදෙෙ ය.
(4) සිවරාත්‍රී පුරාණම්, ඒහාතසි පුරාණම් සහ පිල්ලෙයාර් කදෙෙ ය.

**28.** අපර කිරියෙෙ පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වන්නේ,
(1) මිය ගිය පුද්ගලයන්ගේ ඥාතීන්ගේ ජීවිතය නගා සිටුවීම ය.
(2) මළවුන්ගේ ආත්ම මොක්ෂයට ළඟා කිරීම ය.
(3) මිය ගිය අය නැවත උත්පත්තිය ලැබීම ය.
(4) අවට පරිසරයට හානි ඇති නොවීම ය.

**29.** ප්‍රදිශ්ටය වර්ග අතුරින් 'අන්දරිතම්' යනු
(1) කෝවිලක් නොමැති ස්ථානයක නව කෝවිලක් නිර්මාණය කර කරනු ලබන චාරිත්‍රයකි.
(2) විනාශයට පත් වූ කෝවිලක් තිබුණු ස්ථානයක කෝවිලක් නිර්මාණය කර කරනු ලබන චාරිත්‍රයකි.
(3) කෝවිලක් විනාශයට පත් වූ විට පාලස්තාපනම් කර සිදු කෙරෙන පිළිවෙතකි.
(4) කොවිලෙහි අශුභ සිදුවීමක් සිදු වුවහොත් කරනු ලබන ප්‍රතිකාර වන්දනාවකි.

**30.** සාමීබමුක්ති යනු,
(1) ශිව දෙවියාගේ ස්වරූපය ලබා ගැනීමකි.
(2) ශිව දෙවියන්ගේ ලෝකයේ සිටීමයි.
(3) ශිව දෙවියන් සමග සමීපව සිටීමේ තත්ත්වයයි.
(4) ශිව දෙවියන් හා අත්තුවිදම් ලෙස එකම ස්වරූපයට පත්වීමකි.

**31.** භගවත්ගීතා සහ ධම්මපද යන ග්‍රන්ථ දෙකේම පොදු ලක්ෂණයක් වන්නේ,
(1) මෙම ග්‍රන්ථ දෙකම යුද පිටියෙහි දේශනා කරන ලද ඒවා වීම ය.
(2) මෙම ග්‍රන්ථ දෙකම සංගරර් විසින් අර්ථ පැහැදිලි කරන ලද ඒවා වීම ය.
(3) මෙම ග්‍රන්ථ දෙකම පාලි භාෂාවෙන් ලියන ලද ඒවා වීම ය.
(4) මෙම ග්‍රන්ථ දෙකම මානව විමුක්තිය ලබාගැනීම සඳහා දහමට ප්‍රමුඛස්ථානයක් දිය යුතු බව දැක්වීම ය.

**32.** චිත්‍ර පෞර්ණමි උපවාසය,
(1) මිය ගිය මව වෙනුවෙන් අනුගමනය කරනු ලැබේ.
(2) මිය ගිය පියා වෙනුවෙන් අනුගමනය කරනු ලැබේ.
(3) මිය ගිය පුත්‍රයා වෙනුවෙන් අනුගමනය කරනු ලැබේ.
(4) මිය ගිය බිරිඳ හෝ ස්වාමියා හෝ වෙනුවෙන් අනුගමනය කරනු ලැබේ.

**33.** ශිව දෙවියන්ගේ පූජනීය මුහුණු පමණක් ඇතුළත් වරණය වන්නේ,
(1) සත්තියෝජාදම්, පරම්, වාමදේවම් සහ විපවම් ය.
(2) වාමදේවම්, අඝෝරම්, තත්පුරුෂම් සහ ඊසානම් ය.
(3) පරම්, වියුහම්, අඝෝරම් සහ ඊසානම් ය.
(4) අඝෝරම්, වාමදේවම්, විපවම් සහ ඊසානම් ය.

**34.** සෛව නාවිපාද අතුරින් සරියාපාදම්,
(1) සේවාවන් සහ ආගමික වෘත පිළිබඳව විස්තර කරනු ලබන්නේ ය.
(2) මන්ත්‍ර උච්චාරණය, පූජාව සහ සෙබම් කිරීම පිළිබඳ පවසන්නේ ය.
(3) අෂ්ටාංග සිවයෝගම් ගැන විස්තර කරනු ලබන්නේ ය.
(4) ද්‍රව්‍ය තුන පිළිබඳ සත්‍ය පවසන්නේ ය.

**35.** ස්පරිස තීට්චෙ යනු ඇඳුරුතුමා තම ගෝලයාව ආශිර්වාද හැඟීමෙන්,
(1) දෙනෙත්වලින් බැලීම වේ. (2) අත්වලින් ස්පර්ෂ කිරීම වේ.
(3) වචනවලින් දේශනා කිරීම වේ. (4) මනසෙන් පෙළඹවීම වේ.

**36.** භගවත්ගීතාවේ යෝහංගල් තුනම ඇතුළත් වරණය වන්නේ,
(1) කර්ම යෝගම් , සිවයෝගම් සහ භක්ති යෝගම් ය.
(2) සිවයෝගම්, භක්ති යෝගම් සහ ඥාන යෝගම් ය.
(3) ඥාන යෝගම්, කර්ම යෝගම් සහ සිවයෝගම් ය.
(4) කර්ම යෝගම්, භක්ති යෝගම් සහ ඥාන යෝගම් ය.

**37.** තාවරලිංගම් යනු,
(1) සියලු දෙනාටම වන්දනා කිරීම සඳහා කෝවිල්වල ස්ථිරවම පිහිටුවනු ලබන්නකි.
(2) පුද්ගලයෙකුගේ කැමැත්ත මත ඇඳුරුතුමාගේ දේශනාවට යටත්ව වන්දනා කරනු ලබන ලිංගම් ය.
(3) ගඟේ හෝ වැවේ හෝ දැමීම සඳහා සාදනු ලබන්නකි.
(4) පස්, සහල්, බත් වැනි දේවලින් කරනු ලබන්නකි.

- පහත සඳහන් වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.

| **දෙවියා** | **ග්‍රන්ථය** | **වන්දනාව** |
|---|---|---|
| A – කණ්ණකි | D – මහාභාරත | G – පෛප්පසිප් පරණි |
| B – තිරෞපදෙද | E – ගැමි පිළිවෙත හා සම්බන්ධ ගීත | H – තරුමර් පට්ටාභිෂේකම් |
| C – සේත්‍රපාලහර් | F – සිලප්පතිහාරම් | I – කුලිර්ත්ති පිළිවෙත |

**38.** පාන්වාල රජතුමා කළ යාගයෙන් බිහි වූ ස්ත්‍රිය හා සම්බන්ධ වරණය වන්නේ,
(1) AEH ය. (2) AGI ය. (3) BCI ය. (4) BDH ය.

**39.** බෞද්ධයන් 'පත්තිනි දෙයියෝ' යැයි හඳුන්වනු ලබන දෙවියා හා සම්බන්ධ වරණය වන්නේ,
(1) ADH ය. (2) AFI ය. (3) BEI ය. (4) CGH ය.

**40.** වෛරවර් වන්දනාව හා සම්බන්ධ වරණය වන්නේ,
(1) ADE ය. (2) BEI ය. (3) BFI ය. (4) CEG ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**12 | S | I, II**

0312

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

| | |
|---|---|
| ශෛවනෙරි | I, II |
| சைவநெறி | I, II |
| Saivanery | I, II |

## ශෛවනෙරි II

* **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, දෙවන ප්‍රශ්නය ඇතුළු අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) මුරුග දෙවියන්ට අයත් උපවාස **දෙකක්** සඳහන් කරන්න.

(ii) සිත්තාන්ත අට්ටහම්වලට ඇතුළත් වන ග්‍රන්ථ **දෙකක්** සඳහන් කරන්න.

(iii) වඩමෝඩි සහ තෙන්මෝඩි කුත්තු කලා ආභාසය ලබන හින්දු සාහිත්‍ය **දෙකක්** සඳහන් කරන්න.

(iv) ශෛව ආගම කෙරෙහි තිලහවදියාර් ඇති කර ගත් දැඩි භක්තිය ප්‍රකාශ කරනු ලබන්නේ කෙසේ ද?

(v) කුංගිලියක්කලය නායනාර් විසින් තම නිවසට ආරාධනය කර සංග්‍රහ කරන ලද සමයකුරවර් **දෙදෙනෙකු** සඳහන් කරන්න.

(vi) කුඩමුළුක්කු යන්න 'පෙරුන්සාන්දි' ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද?

(vii) හින්දු ආගමිකයින්ගේ කාලය ගණනය කිරීමේ ක්‍රම අතුරින් සන්ද්‍රමානම් යනු කුමක් ද?

(viii) ශෛව ආගමිකයින් විසින් ආරක්ෂා කළ යුතු අභ්‍යන්තර ආචාරධර්ම **දෙකක්** සඳහන් කරන්න.

(ix) කෝවිල්වල පවත්වනු ලබන උත්සව මගින් ඇති වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.

(x) "යාවර්කුමාම් පිරර්ක්කු ඉන්නුරෛ තානේ" යන තිරුමන්දිරම් ගීතිකා පදයෙන් ප්‍රකාශ කරනු ලබන යහපත් ක්‍රියාව කුමක් ද?

**2.** (i) පහත සඳහන් ගීතිකා අතුරෙන් තෝරා ගත් ගීතිකා **දෙකක්** නිවැරදිව හා නියමිත අනුපිළිවෙළට ලියන්න.

(අ) "අංගමුම් වේදමුම් ඕදු නාවර්..."

(ආ) "තන්දදු උන්තන්නෛ කොණ්ඩදු.."

(ඉ) "පච්චෛමා මලෛපෝල් මේනි..."

(ඊ) "පාලුක්කු පාලහන් වේණ්ඩි..."

(උ) "ආත්තාලෙ එංගල් අහිරාම..."

(ii) ඉහත (i) හි ලියන ලද ගීතිකාවල අදහස සරලව ලියන්න.

**3.** "මාදර් මඩප් පිඩියුම් මඩ ඇන්නමුම් ඇන්නතෝර් ...."

– තිරුඥානසම්බන්තර් –

(i) තිරුඥානසම්බන්තර් විසින් ගායනයෙන් වර්ණනා කරන ලද ශ්‍රී ලාංකේය කෝවිල් **දෙකක්** සඳහන් කරන්න.

(ii) තිරුඥානසම්බන්තර් සමයේ දේව සේවාවන් කළ නායන්මාර්වරුන් **තිදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(iii) තිරුඥානසම්බන්තර් විසින් 'යාල්මුරිප් පදිහම්' ගයන ලද අවස්ථාව කෙටියෙන් පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

**4.** "ඒහම් සත් විප්රා පහුදා වදන්ති"

— ඍග් වේදය —

(i) වේද, 'එළුතාමරෛ' යැයි හඳුන්වනු ලැබීමට හේතුව කුමක් ද?

(ii) ඍග් වේදයේ වර්ණනා කරනු ලබන දෙවිවරු **තිදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(iii) වේදවල කාණ්ඩ **තුන** පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

**5.** "පොය්යිරුණ්ඩ සින්දෙද පොරියිලාර් පෝදමාම්
මෙරණ්ඩුං කානාර් මිහ"

— තිරුවරුට්පයන් —

(i) ආත්මවල අරමුණ කුමක් ද?

(ii) තුන් වාර්ගික මළ (මුම්මලම්) මොනවා ද?

(iii) ප්‍රාර්ත කර්ම, ආහාමිය කර්ම සහ සන්ජිත කර්ම යනාදිය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

**6.** "උණ්ඩි කොඩුත්තෝර් උයිර් කොඩුත්තෝරේ"

— මණිමේහලෛ —

(i) පදිපුණ්ණියම් යනු කුමක් ද?

(ii) සිව බැතිමතුන්ට ආහාර සැපයීමේ සේවය කළ නායන්මාර්වරුන් **තිදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(iii) ආරුමුගනාවලර්ගේ 'කැන්ජිත් තොට්ටි දරුමම්' පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) කොක්කට්ටිච්චෝලෛ තාන්තෝන්රීච්චරම්

(ii) ශෛවපරිපාලන සභාවේ අධ්‍යාපනික සේවාවන්

(iii) ශෛව සාරධර්ම අතුරින් සත්‍යය

(iv) වරලට්චුමි උපවාසය

* * *